මගේ අංකය- DCDSP/02/18/04
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
පෙට්ටිගලවත්ත,ගාල්ල.
2023.05.15

ගරු සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වෙත,
(දකුණු පළාත තුල ලියාපදිංචි සියළුම සමුපකාර සමිති)

**2023 පළාත් පාලන මැතිවරණය සඳහා අපේක්ෂකයින් වශයෙන් ඉදිරිපත්වී ඇති දකුණු පළාත තුල ලියාපදිංචි සමුපකාර සමිතිවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සම්බන්ධවයි.**

දකුණු පළාත තුල ලියාපදිංචි සමුපකාර සමිතිවල ඇතැම් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 2023 පළාත් පාලන මැතිවරණය සඳහා අපේක්ෂකයන් වශයෙන් ඉදිරිපත්වී ඇති අතර ඔවුන් මාගේ අංක දප/3/1 හා 1991.04.04 දිනැති උපදෙස් මත තාවකාලිකව නිවාඩු ලබා ගෙන ඇත.

02. කෙසේ වුවද උක්ත මැතිවරණය සඳහා මේ වන විට නිශ්චිත දිනයක් නියම කර නොමැති බැවින් ඉදිරියේදී කටයුතු කල යුතු ආකාරය සම්බන්ධයෙන් එම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් මා වෙතින් උපදෙස් ඉල්ලා ඇත.

03. ඒ අනුව උක්ත අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 2023.05.15 දින සිට පහත උපදෙස් අනුව කටයුතු කල යුතුවේ.

- තාවකාලිකව නිවාඩු ලබා ගෙන ඇති අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට, තම කැමැත්ත මත 2023.05.15 දින සිට නැවත තම රාජකාරී කටයුතුවල නිරත වීමට හැකියාව ඇත.
- එලෙස නැවත රාජකාරී ඉටු කිරීම සඳහා කැමැත්ත පල කරන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් ඒ බව සමිතියේ ලේකම් වෙත ලිඛිතව දැනුම් දිය යුතු වේ.
- එවැනි ලිඛිත ඉල්ලීමක් ලද පසු සමිතියේ ලේකම් විසින් ඊලඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට සහභාගී වන ලෙස එලෙස ඉල්ලීම් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයාට විධිමත් පරිදි දැනුම් දිය යුතුය.
- අදාල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයා විසින් එම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තමා විසින් තාවකාලිකව ලබා ගන්නා ලද නිවාඩු අවසන් කරන බව දැනුම් දිය යුතු අතර, ලේකම් විසින් ඒ බව අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා පොතේ සටහන් කල යුතුය.

04. කෙසේ වුවද ඉහත පරිදි නිවාඩු අවසන් කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පහත කොන්දේසි වලට යටත්ව තම නිවාඩු අවසන් කල යුතු වේ.

- පළාත් පාලන මැතිවරණය සඳහා නැවත වරක් දින නියම කරනු ලැබූ විට, උක්ත අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින් පෙර පරිදි සමිතියට ලිඛිතව දැනුම්දී තම රාජකාරී කටයුතු වලින් සම්පූර්ණයෙන් ඉවත් විය යුතුය. (තාවකාලිකව නිවාඩු ලබා ගත යුතුය)
- නිවාඩු අවසන් කිරීමෙන් පසු, නැවත මැතිවරණය සඳහා දින ප්‍රකාශ කරනු ලබන දිනය දක්වා වන කාල සීමාව තුල උක්ත අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සමිතිය තුල හෝ සමිතියට අයත් කිසිදු පරිශ්‍රයක සිට ඍජු හෝ වක්‍ර ලෙස දේශපාලන කටයුතු සිදු නොකල යුතු අතර සමිතියේ කිසිදු සේවකයෙක්/දේපළක්/රථ වාහනයන් එවැනි කටයුතු සඳහා යොදා නොගත යුතුය.

- 2023 පළාත් පාලන මැතිවරණය සඳහා අපේක්ෂකයන් වශයෙන් ඉදිරිපත්වී ඇති අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් ඉහත පරිදි කටයුතු කරනු ලබන බවට වගබලා ගැනීම සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමක් බව අවධාරණය කරමි.

05. මෙම උපදෙස් 2023 පළාත් පාලන මැතිවරණයට අදාල වනසේ පමණක් නිකුත් කර ඇත.

ටී.ජී සරත් කුමාර,
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
දකුණු පළාත.

ටී. ජී. සරත් කුමාර
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
දකුණු පළාත

පිටපත්-

| | | |
|---|---|---|
| 01.සහකාර කොමසාරිස්(ගාල්ල/මාතර/හම්බන්තොට) | - | අදාල සියළුම සමුපකාර සමිති දැනුවත් කිරීම සඳහා මෙන්ම සමිති භාර නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් ලබා දීම සඳහා |
| 02.සියළුම සමිති භාර නිලධාරීන් | - | අදාල සියළුම සමුපකාර සමිති දැනුවත් කිරීම සඳහා |
| 03.සියළුම සමුපකාර සමිති ලේකම්වරුන් | - | මෙම උපදෙස් අනුව කටයුතු කිරීම සඳහා හා අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීම සඳහා |